අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/04/05/24

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.11. 02

නම: .....

ලිපිනය : .....
.....
.....

ජා.හැ.අංකය .....

මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම - 2019 (2020)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගය 2019/2020 ට අදාළව අංක 2162 හා 2020.02.07 දිනැති ගැසට් නිවේදනය සහ ඊට අදාළ 2020.10.23 හා 2020.12.04 දිනැති සංශෝධන අනුව 2021.04.25 වන දින පවත්වනු ලැබූ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත හා 2024.11.20 සිට 2024.11.28 දින දක්වා පැවති සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙහි සහ 2026. ජනවාරි මස 13, 20, 23, 27, 30 සහ 2026 පෙබරවාරි මස 03 යන දිනයන්හි පැවති යෝග්‍යතා ඇගයීමේ හා ප්‍රායෝගික පරීක්ෂණයන්හි ද ප්‍රතිඵල මත 2026.11.09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරියෙකු/ නිලධාරිනියක වශයෙන් ඔබ පත්කිරීමට තෝරා ගෙන ඇති බව සතුටින් දැනුම් දෙමි.

02. ඒ අනුව, ඔබගේ පත්වීම් ලිපිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව මඟින් තැපැලෙන් ඔබ වෙත යොමු කර ඇත. එබැවින්, ඔබ සේවයට වාර්තා කිරීම සඳහා 2026.11.09 වන දින **පෙ.ව. 8.30 වන විට ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය සහතික කළ හැකි ලේඛනයක්** රැගෙන බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙහි 7 වන මහල වෙත පැමිණිය යුතු වේ.

03. ඔබ 2026.11.09 දින පැමිණීමේ දී පහත ලේඛන රැගෙන ආ යුතුය.

- ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක්
- උප්පැන්න සහතිකය
- විවාහක නම් විවාහක සහතිකය, කලත්‍රයාගේ උප්පැන්න සහතිකය සහ දරුවන්ගේ උප්පැන්න සහතික

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

04. තවද, මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන ශාඛාව විසින් ඔබට අදාළ සේවාරම්භක පුහුණුව 2026.11.10 දින සිට ලබාදීමට කටයුතු කරන බැවින් 2026.11.09 දින දී අධ්‍යාපන අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) විසින් සේවාරම්භක පුහුණුව සම්බන්ධයෙන් දැනුවත් කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දිමනා කිසිවක් ගෙවනු නොලැබේ.

කේ.කේ.පී. ආරියසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
ලේකම් වෙනුවට